# මාතර දිස්ත්‍රික්කයට ආවේණික මහසෝන් සමයම ශාන්තිකර්මය පිළිබඳ අධ්‍යයනයක්

*එම්.පී.ආර්. තරුෂිකා*[1] *එම්.පී.එච්. මදුසිකා*[2] *ඩී.එම්.වී. විශාකා*[3]

මාතර දිස්ත්‍රික්කය වූ කලී යන්ත්‍ර, මන්ත්‍ර, ගුරුකම්, හදි හූනියම්, බලිතොවිල් ආදි වත් පිළිවෙත් පිළිබඳ ව සමස්ත ශ්‍රී ලංකාවේ ම අවධානය යොමු කරගත් ප්‍රදේශයකි. මහසෝන් යකු හෙවත් මහසෝන් දේවතාවාගෙන් සිදු වන අතුරු අනතුරුවලින් අත්මිදීම සඳහා කරන ශාන්තිකර්මය මහසෝන් සමයම ලෙස හැඳින්වෙන අතර මාතර දිස්ත්‍රික්කයට ආවේණික මහසෝන් සමයම ශාන්තිකර්මය යනු කුමක් ද, යන්න අනෙකුත් ජනයාට විස්තරාත්මක විග්‍රහයක් සිදු කිරීම මෙම පර්යේෂණයේ ගැටලුවයි. අභිචාරාත්මක රෝග නිවාරණ ක්‍රමයක් ලෙස මහසෝන් සමයම පිළිබඳ මිනිසා තුළ පවත්නා විශ්වාසය කෙබඳු ද යන්න පිළිබඳ අධ්‍යයනය කිරීම මෙහි ප්‍රධාන අරමුණ වේ. මෙම පර්යේෂණය විමර්ශනය සඳහා දැනට ලියවී ඇති මූලාශ්‍රයගත සාධක, සම්මුඛ සාකච්ඡා ,සහභාගීත්ව නිරීක්ෂණ තුළින් ලබාගත් දත්ත උපයෝගී කොටගෙන ඇත. සොහොනෙහි ඉපදී, සොහොන්වල හැසිරෙමින් මළ මිනී අනුභව කරනු ලබන බැවින් මොහු මහසෝන් යක්ෂයා ලෙස හැඳින්වෙන අතර, මොහුට අත් හතරක් හිමි ය. නිල්පැහැති ශරීර වර්ණයකට හිමිකම් කියනු ලබන මොහුගේ වාහනය වනුයේ " ඌරා"ය. අතිප්‍රබල යකෙකු ලෙස පිළිගැනෙන මහසෝනා සෙසු යක්ෂයන් මෙන් බැල්ම හෙලීමෙන් පමණක් ලෙඩ ඇති නො කරයි. සොහොන්පළක දී, තොටමුණක දී, පාළුකනත්තක දී බලාපොරොත්තු රහිත අවස්ථාවක දී පහර දී ලෙඩ කිරීම සිදු කරයි. මහසෝනා පහර දුන් පසු පිට පෙදෙස නිල් පැහැ ගැන්වී අතේ ඇඟිලි සටහන් පිහිටීම, කක්කල් කැස්ස, ඔල්මාදය, පිස්සු විකාරයෙන් නන්දෙඩවීම, කෑම අරුචිය, උදර රෝග ආදි රෝග ලක්ෂණ දක්නට ලැබේ. එවන් රෝග ලක්ෂණ ඇත්තේ නම් “ඇප නූල්” බැඳ මහසෝන් සමයමක් නැටීමට කටයුතු කරයි. පවත්නා රෝගී ලක්ෂණ අනුව තොවිලයක් නියම කිරීම සහ අදාළ තොවිලයට අයත් පෙළපාලි ස්වරූපය නියම කිරීම යකදුරෝ සිදු කරති. එක් එක් තොවිලය සඳහා නිශ්චිත පෙළපාලි රටාවක් ඇත්තා සේම, ඊට එක් කළ යුතු අවස්ථා තීරණයට එළඹෙන්නේ අදාළ ආතුරයාගේ රෝගී ලක්ෂණ නිරීක්ෂණයෙන් අනතුරුවයි. අදාළ පෙළපාලි රටාව, නර්තනවල ඇති තාණ්ඩව ලක්ෂණ, භාවපූර්ණ සමයම් නැටීම සහ අවතාර ඉහිලීම් ආදියෙන් මහසෝනා අති ප්‍රබල යකෙකු බවත්, සුව කළ නොහැකි තත්ත්වයේ පවත්නා යක්ෂ රෝගාබාධ සඳහා මෙන් ම එවැනි රෝගී අවස්ථාවක් හේතුවෙන් මරණාසන්න තත්ත්වයට පත්වන රෝගතුරයන්ට නිරෝගී බව උදා කර දෙනු ලබන මහසෝන් සමයම වර්තමානයේ ද මාතර පවතින අතිශය ප්‍රබල ශාන්තිකර්මයක් බවත් නිගමනය කළ හැකි ය.

***ප්‍රමුඛ පදඃ*** මහසෝන් සමයම ශාන්තිකර්මය, යකදුරන්, රෝග ලක්ෂණ, මහසෝන් යක්ෂයා, මාතර

[1] ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය, මිහින්තලේ. tharushikaroshani95@gmail.com

[2] ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය, මිහින්තලේ. harshanimadusika9@gmail.com

[3] ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය, මිහින්තලේ.